*පඨිත:*
*සමාජ සංස්කෘතික සමීක්ෂා*

## පර්යේෂණ ලිපි

පර්යේෂණ ලිපි යන්නෙන් අප අදහස් කරන්නේ, සමාජයීය විද්‍යා හෝ මානව ශාස්ත්‍ර යන පුළුල් විෂය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කරනු ලැබූ ක්ෂේත්‍ර පර්යේෂණ, ඓතිහාසික පර්යේෂණ, සාහිත්‍යය විමර්ශනය හෝ මේ අකාරායේ ප්‍රවේශ කිහිපයක් මත පදනම් වූ පර්යේෂණාත්මක ලිපියකි. මූලික වශයෙන්, එවන් ලිපියක් හුදු විස්තර කථනයක් පමණක් නොවිය යුතුය. එය සමාජ සංස්කෘතික තොරතුරු හා සමාජ න්‍යාය අතර ඇති සම්බන්දයක් මත පදනම් විය යුතු දෙයකි. මෙවන් ලිපියක් සම්පාදනයය කිරීම සඳහා ආකෘතියක් යෝජනා කිරීම වෙනුවට අපගේ උත්සාහය යම් මූලික කරුණු කිහිපයක් අවධාරණය කිරීමය.

*පඨිත: සමාජ සංස්කෘතික සමීක්ෂා* සාර සංග්‍රහයේ අවශ්‍යතාවලට අනුව, ඕනෑම පර්යේෂණ ලිපියක් ආරම්භ විය යුත්තේ පර්යේෂණ ගැටලුවකිනි. නැතිනම්, පර්යේෂණ ප්‍රශ්නයකිනි. එනම්, යම් කිසි කාරණයක් යම් අයුරකින් සිදු වන්නේ කුමක් නිසාද යන ප්‍රශ්නය නැගීමෙන් සහ ඒ ප්‍රශ්නයට මූලික පිළිතුරක් යෝජනා කිරීම මගිනි. මේ ක්‍රියාවලිය ඇතැම් විට උපන්‍යාස ගොඩනැගීම වශයෙන් ද හැඳින්වේ. පර්යේෂණ ලිපි මගින් පසුව කළ යුත්තේ අදල ප්‍රශ්නය හා සම්බන්ධ ව සිදු කරනු ලබන පර්යේෂණවලින් ඒ ගැටළුවට වඩාත් පරිපූර්ණ හා පර්යේෂනයෙන් සොයාගත් සාක්ෂ්‍ය මත පදනම් වූ සහ න්‍යායාත්මක විමර්ශනයකට භාජනය වූ පිළිතුරක් ලබාදීමය. අපගේ විශ්වාසය පර්යේෂණ ලිපියක් යනු මූලික වශයෙන් මෙවැනි රචනයක්ය යන්නය.

මෙවන් ලිපියක් ලිවීම සඳහා අදාළ ප්‍රශ්නය හා සම්බන්ධව පුළුල් සාහිත්‍ය විමර්ශනයක් මුලින්ම සිදුවිය යුතුය. එනම්, ඒ ප්‍රශ්නය පිළිබඳව දැනට දේශීය හා ජාත්‍යන්තර භාෂාවන්ගෙන් පළවී ඇති, නැතහොත් යම්කිසි ස්ථානවල සංරක්ෂණය වී ඇති දැනුම පිළිබඳ පුළුල් මැනැවින් දැනුවත් වීමය. එසේම, සෘජුවම තම පර්යේෂණ ගැටළුව හා සම්බන්ධ නොවූවත් අදාළ කාරණයට යම් ආලෝකයක් සැපය හැකි මූලාශ්‍ර ද මීට ඇතුළත් විය යුතුය. මෙයින් උත්සාහ කරන්නේ, පර්යේෂණයට භාජනය වන කාරණය පුළුල් සමාජීය හා සංසන්දනාත්මක සංදර්භයක මුලින්ම ස්ථානගත කර එය පුළුල් තේරුම් ගැනීමය. මීට අමතරව, පර්යේෂණ ලිපියක් සම්පාදනය කිරීමේදී අදාළ කාරණය යම් ආකාරයකින් සිදුවන්නේ කෙසේද යන්න විස්තර කිරීම් සඳහා යම් න්‍යායික ප්‍රවේශයක හෝ ප්‍රවේශ කිහිපයක ආධාරය ද ලබාගත හැක. මෙහිදී සමාජ න්‍යාය යන්න හුදු ආභරණයක් නොවේ. එමගින් සිදුවිය යුත්තේ, අදාල පර්යේෂණ ගැටළුව හෝ සංසිද්ධිය විස්තර කිරීමේදී යම් ආකාරයකින් එය සිදු වන්නේ කෙසේද යන්න වඩාත් ව්‍යුක්තව විස්තර කිරීමයි.

තම ලිපිය මැනැවින් ගලාගෙන යෑම සඳහා පර්යේෂණ ගැටළුවේ ස්වභාවය සහ තමන්ගේ විෂය ක්ෂේත්‍රය මැනැවින් සැලකිල්ලට ගෙන, උප-මාතෘකා කිහිපයක් ඔස්සේ තම තර්කය සහ විස්තර ගොනු කිරී සාර්ථක ක්‍රමයකි. මෙවන් ලිපියක් ලිවීම සාරාංශයක් ලෙස ගෙන හැර දක්වුවහොත් අපට කිව හැක්කේ, මුලින්ම තමන්ගේ ගැටළුව කෙටියෙන් විස්තර කර, දෙවනුව ඒ ගැටළුව පර්යේෂණ පදනමක් ඔස්සේ සන්දර්භගත කර, එය න්‍යායිකව හා සංකල්පීය වශයෙන් විස්තර කර, තමන්ගෙ ගැටළුව තේරුම් කිරීම සඳහා යම් ප්‍රබල

තර්කයක් ගොඩනැගීම යන දේ සිදුවිය යුතු බවයි. පර්යේෂණ ලිපියක හෝ අන් ආකාරයේ සමාජයීය විද්‍යා නිබන්ධනයක් සම්පාදනය කිරීමේදී එය ව්‍යුහනය කිරීම පිළිබඳ මූලික තොරතුරු හා උපදෙස් *සමාජීය විද්‍යාවන් ලිවීම: රචනා සම්ප්‍රදායන් හා ආචාර ධර්ම පිළිබඳ කෙටි හැඳින්වීමක්*[1] (2012) යන කෘතියෙන් ලබාගත හැක. එය *පඨිත* වෙබ් අඩවියේ පහත සඳහන් සබැඳියාව ඔස්සේ ලබාගත හැක: http://www.patitha.lk/wp-content/uploads/2019/12/%E0%B7%83%E0%B6%B8%E0%B7%8F%E0%B6%A2%E0%B7%93%E0%B6%BA-%E0%B7%80%E0%B7%92%E0%B6%AF%E0%B7%8A_%E0%B6%BA%E0%B7%8F-%E0%B6%BD%E0%B7%92%E0%B7%80%E0%B7%93%E0%B6%B8-2012-1-4-60-91.pdf

පර්යේෂණ ලිපියක් සැම විටම විධිමත් ශාස්ත්‍රීය ලිපියකි. එම නිසා, ශාස්ත්‍රීය ලිපි සම්පාදනයේ දී සාමාන්‍යයෙන් ජාත්‍යන්තරව අනුගමනය කරන විධික්‍රම හා ශෛලීන් මෙහිදී ද අනුගමනය කළ යුතු ය. *පඨිත: සමාජ සංස්කෘතික සමීක්ෂා* සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු භාෂා ශෛලීන් සහ තොරතුරු මූලාශ්‍ර සටහන් කිරීම පිළිබඳ කරුණු *පඨිත* වෙබ් අඩවියේ පහත සබැඳියාවෙන් ලබාගත හැක: http://www.patitha.lk/wp-content/uploads/2019/12/%E0%B7%83%E0%B6%B8%E0%B7%8F%E0%B6%A2%E0%B7%93%E0%B6%BA-%E0%B7%80%E0%B7%92%E0%B6%AF%E0%B7%8A_%E0%B6%BA%E0%B7%8F-%E0%B6%BD%E0%B7%92%E0%B7%80%E0%B7%93%E0%B6%B8-2012-1-4-60-91.pdf

*පඨිත* සඳහා ඉදිරිපත් කරන පර්යේෂණ ලිපියක් වචන 5500 සිට 7000 දක්වා විය යුතුය. ඒ සියළුම මූලාශ්‍ර සටහන් හා පාදක සටහන් ද ඇතුළුවය. අමතර තොරතුරු අවශ්‍ය නම්, කරුණාකර පහත සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනයට ලියන්න: patithaj@gmail.com

*පඨිත* අන්තර්ජාල සංස්කරණය කියවීමට, *පඨිත* හා සම්බන්ධ ප්‍රතිපත්ති හා ලිපි සම්පාදනයේදී අනුගමනය කළ යුතු මූලික කරුණු සඳහා *පඨිත* වෙබ් අඩවියට පිවිසෙන්න: http://www.patitha.lk/

**පඨිත සංස්කාරක මණ්ඩලය**
**2020**
http://www.patitha.lk/

1. සසංක පෙරේරා (චන්ද්‍ර ලේකම්ආරච්චි සංස්කරණය), *සමාජීය විද්‍යාවන් ලිවීම: රචනා සම්ප්‍රදායන් හා ආචාර ධර්ම පිළිබඳ කෙටි හැඳින්වීමක්* කොළඹ: තීර්ථ ජාත්‍යන්තර කලාකරුවන්ගේ එකතුව (2012).